## 2.6 ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ ආරම්භය හා විකාශනය

එම්. කේ ඒ. ඒ. රත්නායක, අනුරුද්ධිකා දිල්හානි
ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

---

## ABSTRACT

නූතන ලොව තුළ ක්‍රීඩාවට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. ක්‍රීඩාවේ ඉතිහාසය අදින් වසර 4000 කට එපිට පැවති බවට සාධක ඇත. නමුත් ක්‍රීඩාවේ වර්ධනීය යුගයක් ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ ග්‍රීසිය මුල්කරගෙන ක්‍රීඩාවේ පුනරුද ඇතිවන කාලයයි. ඔලිම්පික් ක්‍රීඩා උළෙල යනු ක්‍රීඩාවේ මහා මංගල්‍යයවේ. ඔලිම්පියා නගරය මුල්කරගෙන ආගමික පදනම මත ඔලිම්පික් ක්‍රීඩා උළෙල ආරම්භ වූයේ යැයි ජනප්‍රවාදයන්හි සඳහන් වන අතර ඔලිම්පික් ක්‍රීඩාව මිනිසාගේ විවේකය විනෝදයෙන් ගත කිරීමේ මූල අවස්ථාවන්ගේ ආරම්භක අවස්ථාවක් ලෙස ද ඉතිහාසයේ සඳහන්ය. අදවන විට ජාත්‍යන්තර කීර්තියට පත් ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය කෙසේ සිදුවූයේ ද යන්න විමර්ශනය මේ අනුව වැදගත් වනු ඇත.

ඒ බැවින් මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වන්නේ ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය ආගමික පදනමක් මත බිහිවූයේ ඇයි? යන්න පරීක්ෂා කිරීමයි. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික දත්ත පදනම් වියී ද්විතීයික දත්ත ලබා ගැනීමේදී පර්යේෂණයට අදාලව ලියවී තිබෙන පර්යේෂණ වාර්තා, පුවත්පත් ලිපි ප්‍රකාශන, සඟරා, අන්තර්ජාලය සහ සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කරන ලදි.

ග්‍රීසියේ ඇල්ෆියස් නදිය ආශ්‍රිතව ඔලිම්පියා මිටියාවත මුල්කරගෙන පැවති ඔලිම්පික් ක්‍රීඩාව ආරම්භ කිරීමට පුරෝගාමී වූවෝ ග්‍රීකයෝය. මෙය මුලින්ම ආරම්භ කරන ලද්දේ දෙවියන්ට පුදපූජා පවත්වන අදහසිනි. ආරම්භ වූ වර්ෂය ලෙස වාර්තා වන්නේ ක්‍රි.පූ.776 වුවත් එහි ආරම්භය ආසන්නව ක්‍රි.පූ.1300 දී පමණ වන්නට ඇතැයි විශ්වාස කෙරේ.

සිදු කරන ලද අධ්‍යයනයට අනුව අනාවරණය වූයේ ඔලිම්පික් ක්‍රීඩාවේ ආරම්භය ආගමික පදනමක් මත සිදුවී ඇති බවත්, ග්‍රීකයන් විසින් දෙවියන් වෙත කරන පූජා උත්සවයක් ලෙස ආරම්භ වී පසුකාලීනව විවිධ උත්සවාකාරයන්ගෙන් ක්‍රමිකව විකාශනය වී ඇති බවත්ය.

**Key words** ඔලිම්පික්, ක්‍රීඩා උළෙල, ඔලිම්පියා නගරය